# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/40 – 2018 ඔක්තෝබර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2018.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

05 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කෝමංගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ටීඑච්ජී/2018/127 හා 2018.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.3281 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

1. කැබලි අක්ෂර 'ඒ' – තිරාණියවත්ත – ප්‍රමාණය: හෙක්. 1.3281

උතුරට: එච්. එන්. මැනී හිමිකම් කියන තිරාණියවත්ත, මාපලානේ විමලවංශ හිමි හිමිකම් කියන තිරාණියවත්ත, එච්. පී. එරමානිස් හිමිකම් කියන කුඹුරම්මුල්ල, මාර්ගය සහ එල්. පී. නිලන්ති හිමිකම් කියන ගොරකවිටියලහේන; නැගෙනහිරට: එච්. පී. එරමානිස් හිමිකම් කියන කුඹුරම්මුල්ල, එල්. පී. නිලන්ති හිමිකම් කියන ගොරකවිටියලහේන, මාපලානේ විමලවංශ හිමි හිමිකම් කියන තිරාණියවත්ත; දකුණට: මාපලානේ විමලවංශ හිමි හිමිකම් කියන තිරාණියවත්ත, ඇළ සහ මාර්ගය; බටහිරට: ඇළ, මාර්ගය, එච්. එන්. මැනී හිමිකම් කියන තිරාණියවත්ත සහ මාපලානේ විමලවංශ හිමි හිමිකම් කියන තිරාණියවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4–3/15/2017/වීර්/318.
2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 141



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*